# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,445 - 2025 ජූලි මස 11 වැනි සිකුරාදා - 2025.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 944 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 945 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 948 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 955 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ.බ.)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## කඩුගන්නාව නගර සභාව

### කඩුගන්නාව නගර සභාවේ නව ආදාහනාගාරයේ ආදාහනාගාර ක්‍රියාකරු සහ ආදාහනාගාර ක්‍රියාකරු සහායක පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

කඩුගන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩුව පවතින ආදාහනාගාර ක්‍රියාකරු සහ ආදාහනාගාර ක්‍රියාකරු සහායක තනතුරු සඳහා දෛනික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *ආදාහනාගාර ක්‍රියාකරු* | *ආදාහනාගාර ක්‍රියාකරු සහායක* |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයයන් 06 ක් සමත් ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම් හි (NVQ) 3 සුදුසුකම ලබා තිබීම. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරක දී සමත්ව තිබිය යුතුය. |
| පළපුරුද්ද | මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය. | අවශ්‍ය නැත |
| කායික සුදුසුකම් | සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, මධ්‍යම පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. | සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, මධ්‍යම පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. |
| වෙනත් සුදුසුකම් | I. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.<br>II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය. | I. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.<br>II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය. |

බඳවා ගන්නා ලද අයදුම්කරුවන් අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් තනතුරට අදාළ කාර්යයන් ඉටු කිරීමට බැඳී සිටිය යුතුය.

මෙම පත්වීම ස්ථිර තනතුරක් ලැබීමට සුදුසුකමක් නොවේ.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.08.04** දිනට පෙර **"ලේකම්, කඩුගන්නාව නගර සභාව, කඩුගන්නාව"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ආයතනයට අතින් ගෙනවිත් භාර දිය හැකිය. ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්පත්‍රයේ, අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සමිත සපුතන්ත්‍රි,
ලේකම් *(වැ.බ.)*,
කඩුගන්නාව නගර සභාව,

2025 ජූලි මස 11 වැනි දින.

**කඩුගන්නාව නගර සභාවේ නව ආදාහනාගාරයේ ආදාහනාගාර ක්‍රියාකරු සහ ආදාහනාගාර ක්‍රියාකරු සහායක පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**

***(ආදර්ශ අයදුම්පත්‍රය)***

01. සම්පූර්ණ නම :...............................................................................................

02. උපන් දිනය :...............................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :...............................................................................................

04. ස්ථිර පදිංචි ලිපිනය :...............................................................................................

05. දුරකථන අංකය :...............................................................................................

06. ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී/පුරුෂ) :...............................................................................................

07. විවාහක අවිවාහක බව : (විවාහක/අවිවාහක) :...............................................................................................

08. ග්‍රාම සේවක කොට්ඨාසය ::...............................................................................................

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය::...............................................................................................

10. අධ්‍යාපන සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතුය)

...............................................................................................

...............................................................................................

...............................................................................................

11. වෙනත් සුදුසුකම් :

...............................................................................................

ම විසින් මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට මෙයින් සහතික කරමි.

.....................
අයදුම්කරුගේ අත්සන.

දිනය .....................

07-676

# පළාත් පාලන නිවේදන

**ගම්පහ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) "අ" වගන්තිය අනුව කටයුතු කරමින් 24(1) "ආ" වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග ගම්පහ ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කර ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස ඉඩමට හිමිකම්පාන යම් පාර්ශ්වයක්වේ නම් එම පාර්ශ්වය මෙම දැන්වීම පළ කළ දින සිට මාස 01ක් ඇතුළත එම ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙන ලදී. එම ලබා දුන් කාලය තුළ විරෝධතා ඉදිරිපත් නොවූ බැවින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව එම පාරවල් ප්‍රාදේශීය සභා පාරවල් ලෙස පිළිගෙන පාලනය කරන බව වැඩිදුරටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඒ. එන්. පී. සුරවීර,
ගම්පහ ප්‍රාදේශීය සභාවේ ලේකම් හා ගම්පහ ප්‍රාදේශීය සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2025 ජුනි මස 20 වැනි දින.

**උපලේඛනය**

| අනු. අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | මාර්ගයේ නම | මාර්ගයේ | | මාර්ගයේ | | මිනින්දෝරුවරයාගේ නම | පිඹුරුපත් අංකය හා දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | අවසානය | දිග (මී) | පළල (මී) | | |
| 01 | 237 කොස්සින්න නැගෙනහිර 236 පහළ යාගොඩ | කොස්සින්න ඒ. කේ. සී. අමරසිංහ මාවත | කළුවල පාර | යාගොඩ සුමේධ මාවත දක්වා | 1,110 | 5.0 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-042 2024/11/07 |
| 02 | 240/බී බටහිර වැලිවේරිය | ඇඹරළුව අඩසියවස්ගම පාර | 514 බස් මාර්ගය | 514 රතනසිරි හිමි මාවත දක්වා | 1,066 | 4.5 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-043 2024/11/07 |
| 03 | 232 අමුණුගොඩ උතුර | අමුණුගොඩ ගලබඩවත්ත පාර | පරාක්‍රමබාහු පන්සල අසලින් | කිතුල්ගහමුල පාර දක්වා | 0,480 | 4.0 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-044 2024/11/07 |
| 04 | 244 පරකන්දෙනිය දකුණ | බංගලාවත්ත වටරවුම් පාර | බේකරි කඩය අසලින් | බේකරි කඩය දක්වා | 1,475 | 5.5 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-045 2024/11/07 |
| 05 | 209/සී බොල්ලත | බොල්ලත දෙනිය පාර | 276 බස් මාර්ගය | 266 බස් මාර්ගය දක්වා | 0,800 | 4.0 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-046 2024/11/07 |
| 06 | 210 බුළුගහගොඩ | බුළුගහගොඩ මැයි දින මාවත | 276 බස් මාර්ගය | 276 බස් මාර්ගය දක්වා | 0,505 | 3.5 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-047 2024/11/07 |
| 07 | 215 ගලහිටියාව නැගෙනහිර | ගලහිටියාව ශ්‍රමදාන මාවත | ගනේමුල්ල කඩවත මාර්ගය | අන්නාසිවත්ත මාර්ගය දක්වා | 0,280 | 4.0 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-048 2024/11/07 |
| 08 | 232/ඩී මුදුන්ගොඩ බටහිර 233/ඒ මොරගොඩ 2 | මුදුන්ගොඩ එච්. පී. ඩබ්. පෙරේරා මාවත | ගම්පහ පල්ලිය පාර | ඔරුතොට පාර දක්වා | 0,972 | 4.5 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-049 2024/11/07 |
| 09 | 216 හොරගොල්ල උතුර | හොරගොල්ල අනුර මාවත | ගනේමුල්ල කිරිදිවිට පාර | පෙරේරා පාර කෙළවර වෙළ දක්වා | 0,427 | 3.5 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-050 2024/11/07 |
| 10 | 216 හොරගොල්ල උතුර. 216/බී හොරගොල්ල දකුණ | හොරගොල්ල මහවත්ත පාර | 273 බස් මාර්ගය | හොරගොල්ල කුළුණ හන්දිය දක්වා | 0,270 | 3.0 | වී. ෂම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-051 2024/11/07 |

| අනු. අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | මාර්ගයේ නම | මාර්ගයේ | | මාර්ගයේ | | මිනින්දෝරුවරයාගේ නම | පිඹුරුපත් අංකය හා දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | අවසානය | දිග (මී) | පළල (මී) | | |
| 11 | 216 හොරගොල්ල උතුර | හොරගොල්ල රාජපක්ෂ මාවත | ගලහිටියාව පාර කුළුන හන්දිය | රණවිරු ස්මාරකය දක්වා | 0,560 | 4.0 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-052 2024/11/07 |
| 12 | 240 ඉහළ ඉඹුල්ගොඩ උතුර 239/බී ගල්ලොළුව | ඉඹුල්ගොඩ කොතලාවල මාවත | නුවර පාර | ගල්ලොළුව විශාඛා පාර දක්වා | 1,110 | 5.0 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-053 2024/11/07 |
| 13 | 240 ඉහළ ඉඹුල්ගොඩ උතුර | ඉඹුල්ගොඩ පියරතන මාවත | කොළඹ නුවර පාර | බටහිර වැලිවේරිය සුදර්ශනාරාම පාර දක්වා | 2,346 | 6.0 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-054 2024/11/07 |
| 14 | 218 මාකෙවිට | මාකවිට ලොටෝ බෝඩ් පාර | ජා-ඇළ මාර්ගය | වෙල් යාය දක්වා | 0,800 | 3.5 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-055 2024/11/07 |
| 15 | 236 පහළ යාගොඩ | පහළ යාගොඩ පැරණි පාසැල් මාවත | යාගොඩ දුම්රියපළ අසල මාර්ගය | මහවත්ත මාර්ගයේ හන්දිය දක්වා | 0,400 | 2.5 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-056 2024/11/07 |
| 16 | 202/ඒ රත්මල්විට | රත්මල්විට ගම්පහ පාර | ගනේමුල්ල කිරිඳිවිට මාර්ගය | පහලගම බුදුපිළිමය දක්වා | 2,106 | 4.5 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-057 2024/11/07 |
| 17 | 242 ඇඹරළුව උතුර I 240 බටහිර වැලිවේරිය | සුදර්ශනාරාම පාර | නව නුවර පාර (බියගම පාර) | 514 බස් මාර්ගය දක්වා | 1,950 | 5.5 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-058 2024/11/07 |
| 18 | 239/බී ගල්ලොළුව | වැලිවේරිය ගල්ලොළුව පාර | වැලිවේරිය නව නුවර පාර (බියගම පාර) | ඉඹුල්ගොඩ පියරතන මාවත | 1,122 | 6.0 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-059 2024/11/07 |
| 19 | 236/ඒ මාහේන | යාගොඩ මාහේන වත්ත වටරවුම් පාර | ට්‍රැක්මෝ පාර | ට්‍රැක්මෝ පාර | 1,180 | 5.0 | වී. ශම්මුගනාදන් , අංක 30/1/-2/11BC මාවත, වැල්ලවත්ත, කොළඹ 06 | GPS-060 2024/11/07 |

07-684

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 216 රීතියේ විධිවිධානවලට අනුකූලව පහත උපලේඛනවල සඳහන් ආණමඩුව ප්‍රාදේශීය සභාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම්,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2025 ජුනි මස 17 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛන I

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

***මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය***

| | *සටහන්* | *2024.12.31 රු. ශත* | *2023.12.31 රු. ශත* |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 1 | 72,125,785.85 | 56,278,671.98 |
| වෙනත් අයභාරය | 2 | 77,882,707.39 | 64,838,385.74 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | | 150,008,493.24 | 121,117,057.72 |
| මෙහෙයුම් වියදම් | | | |
| පුනරාවර්තන වියදම් | 3 | 120,911,707.68 | 112,914,761.09 |
| **මුළු මෙහෙයුම් වියදම** | | 120,911,707.68 | 112,914,761.09 |
| **වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/(ඌනතාවය)** | | 29,096,785.56 | 8,202,296.63 |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 17,558,567.51 | 6,871,925.00 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 23,360,015.69 | 9,548,233.63 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/(ඌනතාවය)** | | **23,295,337.38** | **5,525,988.00** |

## උපලේඛන II

## 2024.12.31 දිනට

*මූල්‍ය තත්ව ප්‍රකාශය*

| | *සටහන්* | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්:** | | | |
| **ජංගම නොවන වත්කම් :** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 6 | 234,826,524.27 | 238,196,152.57 |
| **ජංගම වත්කම් :** | | | |
| තොග | 7 | 5,744,255.71 | 3,282,683.90 |
| ලැබිය යුතු දෑ | 8 | 70,687,868.48 | 49,725,185.75 |
| සේවක ණය හා අත්තිකාරම් | 9 | 10,575,324.65 | 8,367,403.11 |
| ආයෝජන | 10 | 28,444,128.98 | 22,171,651.82 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 12,665,287.57 | 5,452,208.07 |
| **මුළු වත්කම්** | | **362,943,389.66** | **327,195,285.22** |
| **හිමිකම්** | 12 | 343,237,911.23 | 307,848,074.69 |
| **වගකීම් :** | | | |
| ජංගම නොවන වගකීම් | 13 | - | 822,368.87 |
| ජංගම වගකීම් | 14 | 19,705.478.43 | 18,524,841.66 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **362,943,389.66** | **327,195,285.22** |

## උපලේඛන III

## 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

*මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය*

| | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/ඌනතාවය | 29,096,785.56 | 8,202,296.63 |
| **මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම්** | | |
| ක්ෂය වීම් | - | - |

| | *2024.12.31* *රු. ශත* | *2023.12.31* *රු. ශත* |
|---|---|---|
| **පාරිතෝෂිත වෙන් කිරීම් :** | | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 15,464,127.46 | 21,767,081.93 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | **44,560,913.02** | **29,969,378.56** |
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්) අඩුවීම් | (25,632,176.08) | (11,904,619.73) |
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩි වීම (අඩු වීම) | 1,129,018.18 | 739,097.93 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **20,057,755.12** | **18,803,856.76** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය :** | | |
| ස්ථාවර තැන්පතු | (6,297,112.40) | 14,000,000.00) |
| සේවක ඇප තැන්පතු | 24,635.24 | 9,348.90 |
| ප්‍රාග්ධන වියදම් | (23,360,015.69) | (9,548,233.63) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(29,632,492.85)** | **(23,538,884.73)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය :** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 17,558,567.51 | 6,871,925.00 |
| දේශීය ණය ගෙවීම්/ණය ප්‍රතිව්‍යුහගත කිරීම් | (770,750.28) | (722,371.71) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **16,787,817.23** | **6,149,553.29** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් | 7,213,079.50 | 1,414,525.32 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 5,452,208.07 | 4,037,682.75 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | 12,665,287.57 | 5,452,208.07 |
| **මුදල් හා මුදල් සමාන දෑ :** | | |
| ලංකා බැංකුව - පොදු ගිණුම - 0003860052 | 8,169,625.80 | 3,194,686.82 |
| ලංකා බැංකුව - ව්‍යාපෘති ගිණුම - 0009930549 | 2,538,381.92 | 196,558.92 |
| ලංකා බැංකුව - කර්මාන්ත ගිණුම - 0003860075 | 1,509,879.99 | 1,373,383.11 |
| ලංකා බැංකුව - සේවක ණය ගිණුම - 00038660283 | 447,399.86 | 687,579.22 |
| | 12,665,287.57 | 5,452,208.07 |

07-602

**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ගිණුම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති අංක 171 ප්‍රකාරව, 1989 අප්‍රේල් 17 දිනැතිව අංක 554/5 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ රීති අංක 216 ට අනුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයට අදාළ පහත උපලේඛනයේ සඳහන් වාර්ෂික ගිණුම් වාර්තාව මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

ජී. එන්. එස්. ද සිල්වා,
ලේකම්,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව.

2025 ජුනි මස 26 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**2024 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | *සටහන්* | *2024.12.31 රු. ශත* | *2023.12.31 රු. ශත* |
|---|---|---|---|
| **වත්කම් :** | | | |
| **ජංගම නොවන වත්කම් :** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 6 | 278.327,280.50 | 258,232,667.05 |
| **ජංගම වත්කම් :** | | | |
| තොග | 7 | 3,021,390.80 | 3,219,796.73 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 8,568,361.36 | 8,222,455.36 |
| ලැබිය යුතු දෑ | 9 | 23,213,091.74 | 9,918,549.48 |
| ආයෝජන | 10 | 15,000,000.00 | 10,000,000.00 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 6,907,657.36 | 19,283,946.66 |
| **මුළු වත්කම්** | | **335,037,781.76** | **308,877,415.28** |
| **වගකීම් :** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | - | - |
| ජංගම වගකීම් | 13 | 19,951,382.50 | 23,623,279.98 |
| හිමිකම් | 14 | 315,086,399.26 | 285,254,135.30 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **335.037,781.76** | **308,877,415.28** |

**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**

**2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්කරණ සටහන් (රු.)**

| | *01.01.2024 දිනට පිරිවැය රු. ශත* | *එකතු කිරීම් 2024 රු. ශත* | *ඉවත් කිරීම් 2024 රු. ශත* | *31.12.2024 දිනට ශේෂය රු. ශත* | *31.12.2023 දිනට පිරිවැය රු. ශත* |
|---|---|---|---|---|---|
| **සටහන 06 දේපළ, පිරියත හා උපකරණ :** | | | | | |
| 111 ඉඩම් හා ගොඩනැගිලි | 167,378,075.96 | 12,781,229.70 | 996.835.00 | 179,162,470.66 | 167,378,075.96 |
| 112 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 10,560,700.86 | 732,905.00 | 839,565.00 | 10,454,040.86 | 10,560,700.86 |
| 113 මෝටර් රථ හා කරත්ත | 70,777,824.50 | 7,749,000.00 | - | 78,526,824.50 | 70,777,824.50 |
| 114 ලී බඩු හා සවි කිරීම් | 5.323,206.83 | 204,774.00 | 23,321.25 | 5,504,659.58 | 5,323,206.83 |
| 115 පුස්තකාල පොත් | 4,192,858.90 | 493,172.00 | 6,746.00 | 4,679,284.90 | 4,192,858.90 |
| 116 මෙවලම් හා උපකරණ | - | - | - | - | - |
| **එකතුව** | **258,232,667.05** | **21,961,080.70** | **1,866,467.25** | **278,327,280.50** | **258,232,667.05** |
| **සටහන 07 - තොග :** | | | | | |
| 121 ආයුර්වේද ඖෂධ | | | | - | - |
| 122 ලිපිද්‍රව්‍ය තොග | | | | 2,574,450.80 | 2,979,176.73 |
| 123 ජල ගබඩා තොග | | | | | |
| 124 විදුලි ගබඩාව | | | | 446,940.00 | 240,620.00 |
| **එකතුව** | | | | **3,021,390.80** | **3,219,796.73** |
| **සටහන 08 - සේවක ණයගැති සහ අත්තිකාරම් :** | | | | | |
| 140 සේවක ණය | | | | 8,568,361.36 | 8,222,455.36 |
| **එකතුව** | | | | **8,568,361.36** | **8,222,455.36** |

**2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්කරණ සටහන්**

| | *2024.12.31 රු. ශත* | *2023.12.31 රු. ශත* |
|---|---|---|
| **සටහන 09 - ලැබිය යුතු දෑ :** | | |
| 161 හිඟහිටි වරිපනම් | 701,017.07 | 840,983.80 |
| 162 හිඟහිටි අක්කර බදු | (2,188.00) | 5,851.00 |
| 163 හිඟහිටි වෙළඳ බලපත්‍ර | - | 11,000.00 |

| | *2024.12.31* *රු. ශත* | *2023.12.31* *රු. ශත* |
|---|---|---|
| හිඟහිටි පොළ බදු | - | - |
| කඩ කුළී | 9,498.00 | 9,498.00 |
| ආදායම් ණයගැතියෝ (කර්මාන්ත) | 9,047,015.28 | 373,577.78 |
| ආදායම් ණයගැතියෝ (උසාවි දඩ) | 5,605,970.00 | 1,943,582.00 |
| ආදායම් ණයගැතියෝ (වැටුප් ප්‍රතිපූරණ) | - | 62,108.48 |
| ආදායම් ණයගැතියෝ (මිශ්‍ර ආදායම්) | 613,508.43 | 890.045.49 |
| අයවිය යුතු සේවක (දේපල) ණය පොළී | - | (8,011.45) |
| ආදායම් ණයගැතියෝ (මුද්දර ගාස්තු) | 6,114,761.96 | 4,590,500.00 |
| හිඟහිටි ආදායම් වීරී ලාම්පු | - | 403,416.00 |
| අගරු චෙක්පත්‍ර ගිණුම් | - | - |
| සභාවේ තැන්පත් | 102,500.00 | 102,500.00 |
| අත්තිකාරම් | 215,538.00 | 179,298.88 |
| ලැබිය යුතු කසළ බදු | 85,036.00 | - |
| ලැබිය යුතු උසාවි දඩ | 268,650.00 | 393,650.00 |
| ගිණුම් අතර මුදල් මාරු | 36.825.00 | - |
| දැන්වීම් පුවරු | 402,960.00 | 54,000.00 |
| ණයගැති ප්‍රතිභාවිත ද්‍රව්‍ය | - | 35,599.50 |
| කර්මාන්ත බදු | - | 8,750.00 |
| ව්‍යාපාරික බදු | 12,000.00 | 22,200.00 |
| **එකතුව** | **23,213,091.74** | **9,918,549.48** |
| **සටහන 10 ආයෝජන :** | | |
| ආයෝජන ස්ථාවර තැන්පත් | 15,000,000.00 | 10,000,000.00 |
| **එකතුව** | **15,000,000.00** | **10,000,000.00** |
| **සටහන 11 - මුදල් සහ මුදල් සමාන දෑ :** | | |
| 191 ලංකා බැංකුව ජංගම ගිණුම - 002164030 | 4,834,957.14 | 17,466,230.88 |
| 192 ලංකා බැංකුව ජංගම ගිණුම - 0002163742 | 1,284,887.92 | 1,031,717.92 |
| 193 ලංකා බැංකුව ජංගම ගිණුම - 0002163905 | 787,812.30 | 785,997.86 |
| **එකතුව** | **6,907,657.36** | **19,283,946.66** |
| **සටහන 12 - ජංගම නොවන වගකීම් :** | | |
| 221 දේශීය ණය හා සංවර්ධන අරමුදල | - | - |
| **එකතුව** | - | - |

| | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| **සටහන 13 - ජංගම වගකීම් :** | | |
| ණය හිමියෝ ඉදිකිරීම් | 10,868,622.53 | 7,412,405.90 |
| විවිධ ණය හිමියෝ | 615,234.17 | 539,464.87 |
| පොදු සැපයුම් ණය හිමියෝ | 1,081,004.00 | 572,808.20 |
| නොගෙවූ වැටුප් හා වේතන | - | 508,795.97 |
| කුළී පාලන ගිණුම | 16,000.00 | 16,000.00 |
| ණයහිමි විශ්‍රාම වැටුප් | 2,190,370.74 | 2,113,791.45 |
| විගණන ගාස්තු | 145,000.00 | 115,000.00 |
| **එකතුව** | **14,916,231.44** | **11,278,266.39** |
| කලින් ලද ආදායම් | | |
| වරිපනම් | 55,030.84 | 43,676.15 |
| අක්කර බදු | - | 2,188.00 |
| බලපත්‍ර | - | - |
| කසල බදු | 444,500.00 | 260,000.00 |
| කර්මාන්ත බදු- | - | - |
| ව්‍යාපාර බදු | - | - |
| **එකතුව** | **499,530.84** | **305,864.15** |
| **ආදායම් වෙනුවෙන් තැන්පත්:** | | |
| 254 ඉදිකිරීම් තැන්පත් | 957,586.05 | 716,996.06 |
| 253 ටෙන්ඩර් තැන්පත් | 3,340,689.17 | 11,018,763.25 |
| 256 පුස්තකාල තැන්පත් | - | 86,075.00 |
| 257 විවිධ තැන්පත් | 219,600.00 | 5,000.00 |
| මුද්දර බද්ද | 17,745.00 | 212,315.13 |
| **එකතුව** | **4,535,620.22** | **12,039,149.44** |
| **සටහන 14 - හිමිකම් :** | | |
| 211 - සමුච්චිත අරමුදල් ගිණුම | 36,759,118.76 | 27,021,468.25 |
| 212 ප්‍රාග්ධන යෙදුමට ආදායම් දායකය | 278,327,280.50 | 258,232,667.05 |
| 212 ප්‍රාග්ධන යෙදුමට ආධාර දායකය | - | - |
| **එකතුව** | **315,086,399.26** | **285,254,135.30** |

07-648

# විවිධ දැන්වීම්

## නියාගම ප්‍රාදේශීය සභාව

### අංක 2415 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති නියාගම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා කසල බදු පැනවීමට අදාළ නිවේදනය සංශෝධනය කිරීම

2024.12.13 දිනැතිව අංක 2415 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති නියාගම ප්‍රාදේශීය සභාවට අදාළ කසළ ගාස්තු අය කිරීමට අදාළ *ගැසට්* නිවේදනය සංශෝධනය කිරීමට 2025.06.17 දිනැතිව රැස් වූ නියාගම ප්‍රාදේශීය සභාවේ මහ සභාවට යෝජනා ඉදිරිපත් වූ අතර, 2025.06.17 දිනැති සභා වාර්තාවේ අංක 2025/06/17/ඉ/13 යටතේ එකී යෝජනාව සභා සම්මත කරන ලදී. ඒ අනුව එකී ගැසට් නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දන්වමි.

***2025 වර්ෂය සඳහා කසල ගාස්තු පැනවීම***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 93 සහ 126(ix) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත 2013.10.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති අංක 1834 දරන *ගැසට්* නිවේදනයේ දක්වා ඇති ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව නියාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඒ බව අංක 514 හා 2024 නොවැම්බර් මස 01 දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කර ඇති අතර, එකී අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති ප්‍රතිපාදන පරිදි නියාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වරිපනම් බල ප්‍රදේශයෙන් පිටත පවත්වාගෙන යනු ලබන සාප්පු හා කාර්යාල, හෝටල්, එළවළු හා පළතුරු වෙළඳසැල්, මස්, මාළු කුකුළු මස් හා බිත්තර වෙළෙඳ කුටි, පදික වෙළෙඳාම්, කර්මාන්ත ශාලා, ආරෝග්‍යශාලා එකී පනතේ අංක 20 යටතේ දක්වා ඇති වෙනත් පරිශ්‍රයන්වලින් හා නියාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වරිපනම් බල ප්‍රදේශයෙන් පිට කැනීම් ඉදිකිරීම් හෝ කඩා දැමීම්වලින් ජනනවන අපද්‍රව්‍ය එක් රැස් කිරීම වෙනුවෙන් වරිපනම් බල ප්‍රදේශයෙන් පිටත එකී පරිශ්‍රයන් හි කසල ලබා දෙන්නන් විසින් 2024.12.13 දින අංක 2415 දරන *ගැසට්* නිවේදනයේ මෙම කරුණට අදාළව දක්වා ඇති උපලේඛනය පරිදි 2025.07.01 දින සිට කසල ගාස්තුවක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට නියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එල්. සිදත් කුමාර,
සභාපති.
නියාගම ප්‍රාදේශීය සභාව.

2025 ජුනි මස 17 වැනි දින,
නියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-594

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.